**පුවත්පත් නිවේදනය**

**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලද**

**ශංකර් ජාත්‍යන්තර ළමා තරඟය - 2020**

ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ශංකර් ජාත්‍යන්තර තරඟය විසිවන වරටත් 2019 නොවැම්බර් මස 23 වන දින ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේදී (පෙර ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථානය ලෙස හඳුන්වන ලදී) පැවති අතර එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ඉන්දීය මහ කොමසාරිස් ගරු තරංජිත් සිං සන්ධු මැතිතුමා සහභාගී විය.

මෙ සඳහා 500 කට අධික ළමා සිත්තරුන් පිරිසක් සමස්ත ශ්‍රී ලංකාවම නියෝජනය කරමින් සහභාගී වූ අතර මහ කොමසාරිස්තුමා විශ්ලේෂණාත්මකව සිතීමේ හැකියාව සහ නව අදහස් සහ හැකියාවන් අත්හදා බැලීමට දරුවන් දිරිගන්වන මෙවැනි වැඩසටහන් වලට දරුවන් සහභාගී කරවීම සම්බන්ධයෙන් දෙමාපියන්ටද ගුරුවරුන්ටද සිය ප්‍රශංසාව පළ කළේය.

“අපට ඇති එකම නිවස මිහිතලයයි. එය රැකගනිමු” යන තේමාව ඔස්සේ සිතුවම් සහ රචනා ඉදිරිපත් කරමින් දිවයින පුරා සිටින දරු දැරියන්ට සිය හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට මෙම තරඟය මාහැඟි අවස්ථාවක් ලබා දුන්නේය.

ශංකර් ළමා තරඟය - 2020 හි වර්ණවත් සිතුවම් මේ සමඟ අමුණා ඇත.

තරඟ කොන්දේසි සහ වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක 2684698 ඔස්සේ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය අමතන්න . නැතිනම් iccrcolombo2@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපැලක් යොමු කරන්න.

කොළඹ

2019 නොවැම්බර් 25